**හානි පූර්ණය සඳහා වන කාර්යාලය - 2022**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 | | |
| 70 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් 2023 දෙසැම්බර් 31 දිනට පෙර උපලබ්ධි වන ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණයදෙන ආයතන වෙත ආයෝජනය කර ඇති රු.222,489,000 ක මුදලක් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. | මෙම මුදල 2023 වර්ෂයේ දී කල්පිරිමට නියමිත හෙයින් එය කෙටිකාලීන වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, අතපසුවීමකින් එසේ කිරීමට නොහැකි විය. කෙසේ නමුත් 2023 වර්ෂයේ සිට නිවැරදිව ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 70 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 | | |
| (i.) ප්‍රමිතියේ 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුවුවද ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් පන්ති 03 ක් | නිරීක්ෂණය නිවැරදි, 2023 වර්ෂයේ දී මෙකී වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කොට අවසන් ගිණුම් මගින් ගැලපුම් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රත්‍යාගණනය කර ඇති අතර ඉන් වත්කම් පන්ති දෙකක් වන යන්ත්‍ර, පිරියත හා පරිගණක යන වත්කම් පන්ති දෙකෙහි සම්පූර්ණ වත්කම් පන්ති වෙනුවට යන්ත්‍ර හා පිරියතවලට අදාළ විෂයයන් 11 ක් හා පරිගණක වත්කම්වලට අදාළ විෂයයන් 78 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රත්‍යාගණනය කළ දිනය වන 2022 දෙසැම්බර් 31 දිනට එම වත්කම් පන්තිවලට අයත්ව තිබූ පොත්වල අගය රු.517,523 ක් වූ යන්ත්‍ර හා පිරියතවලට අදාළ විෂයයන් 03 ක් හා රු.4,315,472 ක් වූ පරිගණක වත්කම්වලට අදාළ විෂයයන් 105 ක් ප්‍රත්‍යා ගණනය කර නොතිබුණි. | | |
| (ii.) | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් පසුගිය වර්ෂයේ දී ආයතනය වෙත ලබා දී තිබූ එහෙත් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ ලී බඩු උපකරණවලට අදාළ විෂයයන් 60 ක් සමාලෝචිත වර්ෂයේ දී රු.350,600 ක් වූ වටිනාකමකට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණද මෙම ප්‍රමිතයේ 86 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී අවසන් ගිණුම් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 86 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii.) | ප්‍රමිතියේ 92 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පරිශිලකයන් වෙනුවෙන් ක්‍රියාකාරී භාවයෙන් විශ්‍රාම ගන්වා ඇති සහ බැහැර කිරීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය කළ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු නමුත් 2021 වර්ෂය තුළ සිදුකරණු ලැබූ භාණ්ඩ සමීක්ෂණය මගින් විකිණීමට නිර්දේශ කර ඇති භාණ්ඩ අයිතම 50 ක වත්කම් සම්බන්ධ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිසි ක්‍රමවේදයකට අනුව වෙන්දේසි කර අවශ්‍ය ගැලපුම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් සිදු කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී වන්දිලාභීන් හතරදෙනෙකුට ගෙවන ලද රු.364,300 ක් වටිනා වන්දි මුදල් ගිණුම්ගත නොවීම නිසා වියදම රු.364,300 කින් අඩුවෙන් හා මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | 2023 පෙබරවාරි මස මුදල් පෙතට අදාළ ගැලපුම් සිදු කර නිවැරදි කර ඇත. මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් වැළැක්වීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කර ඇත. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6. මුදල් කළමනාකරණය

### 1.6.1. අක්‍රීය බැංකු ගිණුම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාණිජ කර්මාන්ත ණය අයකිරීම් රැස්කර ගැනීම සඳහා ලංකා බැංකුවේ තැපැල්ප්‍රොබෙන් ශාඛාවේ ආරම්භ කර ඇති ගිණුම් අංක 2026496 දරණ බැංකු ගිණුම 2014 වර්ෂයේ දෙසැම්බර් මස සිට අක්‍රියව පැවතුණි. විගණන දිනය වන 2023 මැයි 10 දින වන විට මෙම ගිණුමේ 2014 වර්ෂයේ දෙසැම්බර් මස සිට රු. 315,284 ක ශේෂයක් පැවතුණි. මෙම බැංකු ගිණුම 2018 ජූලි 26 දින භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ 3/2018 ප්‍රකාරව වසා දැමීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සාමාජික මණ්ඩල රැස්වීමට කරුණු දක්වමින් මෙම බැංකු ගිණුම් වසා දැමීමට අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරන ලදි. | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ 3/2018 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.2. ජංගම ගිණුමේ රඳවාගෙන ඇති මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒකාබද්ධ ණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය තුළ උපලබ්ධි වී තිබුණු රු.114,989,000 ක ආයෝජනවලින් 2022 ඔක්තෝබර් 21 දින සිට පැවති රු.20,000,000 ක මුදල් සහ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරය වෙතින් ලැබුණු 2022 මාර්තු 22 වන දින සිට රඳවා තබාගෙන ඇති රු.5,081,456 ක මුදල් කිසිදු ආර්ථික ප්‍රතිලාභයකින් තොරව විගණන දිනය දක්වා හානි පූර්ණ කාර්යාලයේ බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඒකාබද්ධ ණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම මුදල භාවිතයෙන් ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් වන සමෘද්ධි බැංකුව සමග ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ සඳහා භාන්ඩාගාරයේ නිර්දේශ ලද වහාම අදාළ ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ වෙනුවෙන් අදාළ මුදල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ජංගම ගිණුමේ තැන්පත් කර ඇත.<br><br>2021 ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 10 ක් වෙන් කර තිබුණි. 2021 මෙකී ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලද අක් මුදල් වැය කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද එහි අඩංගු | ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන පරිදි බැංකු ජංගම ගිණුමේ මුදල් මෙසේ රඳවා තබා ගැනීම නොකල යුතුය. |

| | | |
|---|---|---|
| | කාමර වෙන් කිරිම සඳහා භාවිතා කිරීමට සැලසුම් කර තිබුණි. කාර්යාලය වෙනත් පරිශ්‍රයකට ගෙන යාම නිශ්චිත නොවූ බැවින් මෙකී වියදම් නොදරා අනාගතයේ දී දීර්ඝකාලීනව කුලී ගිවිසුම අළුත්කරගත පසු භාවිතා කිරීමට මෙකී ප්‍රාග්ධන අක්මුදල් තබාගන්නා ලදි. කෙසේ නමුත් 2023 වර්ෂයේ දී කාර්යාලය නව ස්ථානයකට ගෙන යන ලදි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,946,070 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,114,511 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,168,441 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම සහ වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම් අඩුවීම බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ වන්දි ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී අනාවරණය වූ පරිදි වන්දි යෝජනා ක්‍රම 04 ක් යටතේ 2002 වර්ෂයේ සිට ආයතනය වෙත යොමු කර තිබූ රු.653,087,126 ක් වටිනා වන්දි අයදුම්පත් 4,770 ක් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වන්දි මුදල් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | අප විසින් වන්දි ලබා දෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන හා අක් මුදල් භාවිතයෙන්ය. ඒ අනුව 2022 වර්ෂයේ දී ලබා දුන් සියලුම අක් මුදල් උපයෝජනය කරමින් වන්දි ලබා දී ඇත. ප්‍රවර්ථන වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් වන්දි අයදුම්පත් 4,770 සඳහා කාල විශ්ලේෂණය පදනම මත වර්ෂය අනුව ප්‍රමුඛතාවය දීමට කටයුතු කර ඇත. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස් කර නියමිත වේලාවට ප්‍රතිපාදන ලබා ගෙන වන්දි ගෙවීම් සිදු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද වන්දිලාභීන් හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබා දීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වී නොතිබුණි. 2022 වර්ෂය සඳහා වන්දි ප්‍රතිලාභීන් හට ලබාදී තිබුණු චෙක්පත් අතුරින් රු.18,056,625 ක් වටිනා චෙක්පත් 150 ක තොරතුරු නිවැරදි නොවීම මත බැංකුව විසින් අගරු කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ රු.29,876,935 ක් වටිනා චෙක්පත් 448 ක කාලය දීර්ඝ කිරීම් කර තිබූ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් වන්දි ප්‍රතිලාභීන් වෙත ලබා දීමේ දී එක් එක් ප්‍රතිලාභීන් වෙනුවෙන් වෙන වෙනම චෙක්පත් නිකුත් කිරීම මීට පෙර සිදුකරන ලදි. එහිදි සිදුවන ඇතැම් දෝශ කඩිනමින් හඳුනාගැනීමට ඉතා ඉක්මනින් ප්‍රතිලාභීන් වෙත වන්දි මුදල් ප්‍රේෂණය කිරීම සඳහාත් ස්වයංක්‍රීය ක්‍රමය ඔස්සේ ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත මුදල් බැර කිරීම සිදු කරමින් පවති. අප කාර්යාලයේ දිස්ත්‍රික් කාර්යාලවල අනුබද්ධ නිලධාරීන් මාර්ගයෙන් මෙකී වන්දි ලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමේ අඛන්ඩ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි. | අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම සිදු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහ පාලනය**

**4.1. වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තියට අනුව සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව එන වර්ෂයට පසුව එළඹෙන මාස 10 අවසන් වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2023 මැයි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි | 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රිත පිටපත් ලද විගස පාර්ලිමෙන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තියට අනුව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 78 ක් වූ අතර, තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 54 ක් වූයෙන් තනතුරු 06 කට පුරප්පාඩු 24 ක් පැවතුණි | අංක අමප21/1596/304/134 හා 2021 සැප්තැම්බර් 07 දිනැති චක්‍ර ලේඛය ප්‍රකාරව නිලධාරීන් බඳවාගැනීම තාවකාලිකව නවතා ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැක. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය. |